*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

**06 ශ්‍රේණිය** **ඉතිහාසය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයිඃ
සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

01 පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වන්නේ ........................................... යි. (මහාවංසය / රුවන්වැලිසෑය / දීපවංසය)

02 බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණය සිදුවූයේ ........................................................................ දී ය. (ක්‍රිස්තු වර්ෂ 1 / ක්‍රිස්තු වර්ෂ 274 / කි.පූ. 544)

03 ශක වර්ෂ ක්‍රමය ........................................................................................................ දින දර්ශනයකි. (හින්දූන්ගේ / මුස්ලිම්වරුන්ගේ / බෞද්ධයන්ගේ)

04 පොළොන්නරුවේ ගල් විහාරය ........................................................................................ නිර්මාණයකි. (I විජයබාහු රජුගේ / මහසෙන් රජුගේ / I පරාක්‍රමබාහු රජුගේ)

05 මහාවංශය රචනා කරන ලද්දේ ........................................................................................ විසිනි. (මහානාම හිමි / වැත්තෑවේ හිමි / තොටගමුවේ රාහුල හිමි)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06 අහසේ සැදුණු දූලි වලාවක් ''නිහාරිකාවක්'' ලෙස හැඳින්වේ. (   )

07 පෘථිවිය සෑදෙන අවස්ථාවේ එය මහත් උණුසුමකින් පැවති අතර වර්තමානයේ එය මුළුමනින් ම සිසිල් වී ඇත. (   )

08 මිනිසා බිහිවීම ආරම්භ වන්නේ වානර පරම්පරාවකිනි. (   )

09 ''හැකි මිනිසා'' යනු හෝමෝ නියැන්ඩතාලන්සිස් මානවයායි. (   )

10 ධාතුසේන රජුගේ පියා දාඨානාම නම් විය. (   )

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11 ''නීග්‍රොයිඩ්'' ජනතාව පැතිරී ඇත්තේ මින් කුමන ප්‍රදේශයේ ද?

(i) ආසියාව (ii) ඔස්ට්‍රේලියාව (iii) අප්‍රිකාව (iv) ඇමරිකාව

12 මිනිසකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණි ම වානරයා වූයේ,

(i) හෝමෝ හැබිලස් මානවයා ය. (ii) ඔස්ට්‍රලෝපිතිකස් මානවයා ය.

(iii) හෝමෝ ඉරෙක්ටස් මානවයා ය. (iv) හෝමෝ සේපියන් මානවයා ය.

13 වළගම්බා රජු විසින් සාදන ලද ස්තූපයකි

(i) ජේතවනය (ii) අභයගිරිය (iii) ථූපාරාමය (iv) මිරිසවැටිය

14 මිනිසා මුල්වරට ගින්දර සොයාගත් බවට සාක්ෂි හමුවන්නේ,

(i) ඊශ්‍රායලයෙනි (ii) ජෙරුසලමෙනි

(iii) පලස්තීනයෙනි (iv) ඇෆ්ගනිස්ථානයෙනි

15 මළසිරුරු කල්තබා ගැනීමේ මමීකරණ ක්‍රමය ලෝකයට හඳුන්වා දුන් ශිෂ්ඨාචාරය වන්නේ,

(i) චීන ශිෂ්ටාචාරය (ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

(iii) ඊජිප්තු ශිෂ්ටාචාරය (iv) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට **A** තීරුවට ගැලපෙන පිළිතුර **B** තීරුවෙන් තෝරා යා කරන්න.

| | **A** තීරුව | | **B** තීරුව |
|---|---|---|---|
| 16 | මැටි දැකැත්ත | A | පැලියොසොයික යුගය |
| 17 | මානව පරිණාමය | B | ප්‍රොකායෝට් බැක්ටීරියාව |
| 18 | රතු ගුරු ගල් | C | නව ශිලා යුගය |
| 19 | ගොඩබිම ශාක පැතිරීයාම | D | මහා හිම යුගය |
| 20 | පෘථිවියේ ඇතිවූ මුල්ම ජීවය | E | පුරා ශිලා යුගය |

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01 (i) ඉතිහාසය හැදෑරීම සඳහා වර්තමාන දී කාලය මැනීම සඳහා සුලබව යොදාගන්නා ක්‍රම දෙකකි. ඒවා නම් කරන්න. (ල. 02)

(ii) පාසලේ ඉතිහාසය හැදෑරීමට වැදගත් වන මූලාශ්‍ර 2 ක් ලියන්න. (ල. 02)

(iii) ''ශක වර්ෂ'' ආරම්භවීමට හේතුව කෙටියෙන් ලියන්න. (ල. 02)

(iv) මානවයාගේ සංස්කෘතික දියුණුව අනුව බෙදෙන ප්‍රධාන සංස්කෘතික අවධි තුන නම් කරන්න. (ල. 03)

(v) 1. අතීතයේ මිනිසා විසින් නිර්මාණය කරන ලද කාන්තා රූපයක් මෙහි A රූපයෙන් දක්වේ. එය සාදන ලද යුගය කුමක් ද? (ල. 01)

2. එය සාදා ඇති ද්‍රව්‍ය කුමක් ද? (ල. 01)



A

(vi) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් බුද්ධ වර්ෂවලට හරවන්න. පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න. (ල. 04)

( 2359, 274, 611, 1166 )

| | සිදුවීම | ක්‍රි. ව. | බු. ව. |
|---|---|---|---|
| 1. | වසභ රජුගේ කාලය ආරම්භ වීම | 67 | ............................ |
| 2. | මහසෙන් රජුගේ රාජ්‍ය කාලය ආරම්භ වීම | ............................ | 818 |
| 3. | හිජ්රි වර්ෂ ආරම්භය | 622 | ............................ |
| 4. | ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයට යටත් වීම | 1815 | ............................ |

(vii) ''මැමත් අලි'' ජීවත් වූයේ කුමන යුගයේ ද? (ල. 01)

02



A



B



C



D

(i) ඉහත දක්වෙන්නේ හෝමෝ සේපියන්වරුන්ගේ විවිධ ප්‍රභේදයන් ය. එම මානව ප්‍රභේද හඳුනාගෙන A, B, C, D පිළිවෙළින් නම් කරන්න. (ල. 04)

(ii) එම මානව ප්‍රභේදයන් ජීවත්වන රටවල් 1 බැගින් නම් කරන්න. (ල. 04)

(iii) පෘථිවියේ පැවති අධික ශීතල දේශගුණය වෙනස් වී ලෝකය උණුසුම් වී නව අලුත් දේශගුණ තත්වයන් බිහිවූ යුගය කුමක් ද? (ල. 01)

(iv) නව ශිලා යුගයේ මිනිසුන් දඩයම් කිරීමට අමතරව තම ආහාර සපයා ගැනීම සඳහා අනුගමනය කරන ලද වෙනත් ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

03 (i) පහත දක්වෙන තොරතුරු වගුවේ දක්වෙන යුග තුනට ගැළපෙන ලෙස තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අකුර වගුවේ ලියන්න.

A කණ්ඩායම් ලෙස එළිමහනේ ජීවත් වීම.

B ගුරුගල්වලින් මළමිනීවල ඇටසැකිලි ආලේප කිරීම.

C ලෝහ ආයුධ තැනීම.

D දඩයම වෙනුවට ගස්වල ගෙඩි, කොළ, අලවර්ග ආහාරයට ගැනීම.

E වගාවන්ගේ ආරක්ෂාවට දෙවියන් ඇදහීම.

F දුනු ඊතල භාවිතයෙන් දඩයම් කිරීම.

| නව ශිලා යුගය | මධ්‍ය ශිලා යුගය | පුරා ශිලා යුගය |
|---|---|---|
| | | |

(ල. 06)

පහත රූප සටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



(ii) මෙම නිර්මාණය කුමන යුගයට අයත් ද? (ල. 02)

(iii) එය සෑදීමට භාවිත කර ඇති ද්‍රව්‍ය කුමක් ද? (ල. 01)

(iv) මෙය නිර්මාණය කළා යැයි සැලකෙන මානවයා කවුරුන් ද? (ල. 02)

04 (i) චීන ශිෂ්ටාචාරය ලෝකයට හඳුන්වා දුන් දායාද 3 ක් නම් කරන්න. (ල. 03)

(ii) ''මෙසපොතේමියා'' යන වචනයේ අදහස කුමක් ද? (ල. 02)

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ විසූ ජනයා භාවිත කළ ලෝහ වර්ග 3 ක් නම් කරන්න. (ල. 03)

(iv) ඊජිප්තු වැසියන් ලෝකයට දායාද කළ විශිෂ්ටතම නිර්මාණය කුමක් ද? (ල. 02)

(v) ඊජිප්තු ශිෂ්ටාචාරයට අයත් උගතුන් ලිවීමට භාවිත කළ සංකේත හඳුන්වන්නේ කවර නමකින් ද? (ල. 01)

05 (i) පහත සඳහන් රජවරු කර වූ වැවක් බැගින් නම් කරන්න.

1. පණ්ඩුකාභය රජු -
2. ධාතුසේන රජු -
3. දේවානම්පියතිස්ස රජු -
4. මහසෙන් රජු -
5. වසභ රජු - (ල. 05)

(ii) දුටුගැමුණු රජතුමාගේ දසමහා යෝධයින් අතරින් තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

(iii) පහත සඳහන් රජවරු ඉදිකළ ස්තූපය බැගින් නම් කරන්න.

1. මහසෙන් රජු -
2. දුටුගැමුණු රජු -
3. දේවානම්පියතිස්ස රජු - (ල. 03)

06 (i) කොටුව තුළ දී ඇති මූලාශ්‍රයන් සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස වර්ගකර වගුව සම්පූර්ණ කරන්න.

මිනිස් ඇටකටු, දීපවංශය
මහා වංශය, පැරණි ජනකතා
සමාධි බුදු පිළිමය
ත්‍රිපිටකය, මහමෙවුනා උයන
සීගිරි චිත්‍ර

| සාහිත්‍ය මූලාශ්‍ර | පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර |
|---|---|
| | |


(ල. 08)

(ii) ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජනයක් ලියන්න. (ල. 01)

(iii) ලංකා ඉතිහාසයේ සිටි රජවරන් රාජ සභාවේ අසුන් ගැනීමට භාවිත කළ ආසනය හැඳින්වූයේ කුමන නමකින් ද? (ල. 01)

(iv) ලංකාවේ සිටි ප්‍රසිද්ධ පුරාවිද්‍යාඥයකුගේ නමක් ලියන්න. (ල. 01)

07 (i) පහත උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව පුරවන්න.




<u>පහළට</u>

1. වානරයාගෙන් මානවයා බිහිවීමේ ක්‍රියාවලිය මේ නමින් හඳුන්වයි.
2. ගිනිකන්දක් පිපිරීමෙන් මේවා පහළට ගලා හැලේ.
3. ලංකාවේ උතුරු පළාතේ ඇති ආගමික හා පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති දූපතකි.
4. වසභ රජතුමා විසින් ලියාන ලද අස්පතකි.

<u>හරහට</u>

1. අතීතය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා යොදාගතහැකි ඕනෑම දෙයක් පොදුවේ මේ නමින් හැඳින්වේ.
2. අතීත මිනිසුන් වර්ණ සාදා ගැනීමට මේවා යොදාගන්නා ලදී.
3. මහම්මත්තුමා මක්කම සිට ගිය නගරය මේ නමින් හැඳින්වේ.
4. ශ්‍රී ලංකාවේ පැරණිතම සාහිත්‍යමය මූලාශ්‍රයකි. (ල. 08)

(ii) සංඝමිත්තා තෙරණිය ලංකාවට ගොඩබට වරාය කුමක් ද? (ල. 01)

(iii) බුදු සසුනේ පැවිදි වූ ලංකාවේ පළමු භික්‍ෂුන් වහන්සේ හා භික්‍ෂුනින් වහන්සේ නම් කරන්න. (ල. 02)

| 06 ශ්‍රේණිය | අනාවරණ පරීක්ෂණය 2021 | ඉතිහාසය |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | රුවන්වැලිසෑය | 02. | ක්‍රි.පූ. 544 | 03. | හින්දුන්ගේ | 04. | I පරාක්‍රමබාහු | | | | |
| 05. | මහානාම හිමි | 06. | (✓) | 07. | (✗) | 08. | (✓) | 09. | (✗) | | |
| 10. | (✓) | 11. | iii | 12. | ii | 13. | i | 14. | ii | 15. | iii |
| 16. | C | 17. | D | 18. | E | 19. | A | 20. | B | | |

(2 x 20 = ල. 40)

## II කොටස

01. (i) ක්‍රිස්තු වර්ෂ, ක්‍රිස්තු පූර්ව
(ii) ලොග් පොත, පැරණි නාම ලේඛන, පැරණි වාර්තා පොත්
(iii) ඉන්දියාවේ බටහිර ප්‍රදේශයේ රජ කළ ගෞතමී සාතකර්ණ පුත්‍ර රාජු ශකවරු සමග සටනෙන් ශකවරු පරදා ජයග්‍රහණය කළ දිනය සිහිවීමට
(iv) පුරා ශිලා යුගය, මධ්‍යශිලා යුගය, නවශිලා යුගය
(v) 1. පුරා ශිලා යුගය පසු භාගය 2. සත්ව ඇට කැබැල්ලකින්
(vi) 1. බු. ව. 611 2. බු.ව. 1166 3. බු.ව. 818
4. බු.ව. 2359 5. මහා හිම යුගය

02. (i) A කොකසොයිඩ් B නිග්‍රොයිඩ්
C ඔස්ට්‍රලොයිඩ් D මොන්ගොලොයිඩ්
(ii) A ඇමරිකාව, රුසියාව, ග්‍රීන්ලන්තය B අප්‍රිකාව
C ආසියාව D පිලිපීනය, චීනය, ජපානය
(iii) හෙලෝසීන යුගය
(iv) සත්ව පාලනය, ගොවිතැන

03 (i) A - C, E B - D, F C - A, B
(ii) නව ශිලා යුගය
(iii) සත්ව ඇටකැබලි
(iv) හෝමෝ සේපියන්

04 (i) කඩදාසි, මාලිමා යන්ත්‍රය, වෙඩිබෙහෙත් (ii) ගංගා දෙකක් මැදිවනසේ පිහිටි රට
(iii) තඹ, ලෝකඩ, ඊයම් (iv) පිරමීඩ
(v) ඊජිප්තු චිත්‍රාක්ෂර නමින්

05 (i) 1. බසවක්කුලම වැව 2. කලාවැව 3. තිසාවැව
4. මින්නේරිය වැව 5. මහවිලච්චිය වැව
(ii) නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න.
(iii) මහසෙන් රජු - ජේතවනාරාමය
දුටුගැමුණු රජු - රුවන්වැලි සෑය, මිරිසවැටිය
දේවානම්පියතිස්ස රජු - ථූපාරාමය

06 (i)

| <u>සාහිත්‍ය මූලාශ්‍ර</u> | <u>පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර</u> |
|---|---|
| දීපවංශය | මිනිස් ඇටකටු |
| මහාවංශය | සමාධි බුදු පිළිමය |
| පැරණි ජනකතා | මහමෙව්නා උයන |
| ත්‍රිපිටකය | සීගිරි චිත්‍ර |

(ii) ගැළපෙන පිළිතුරට ලකුණු ලබාදෙන්න.
(iii) සිංහාසනය / රාජාසනය
(iv) සෙනරත් පරණවිතාන මහතා

07 (i) <u>පහළට</u>
1. පරිණාමය 2. ලාවා 3. නාගදීපය 4. වතුර
<u>හරහට</u>
1. මූලාශ්‍රය 2. රතු ගුරුගල් 3. මදීනා 4. දීපවංශය
(ii) දඹකොළපටුන
(iii) අරිට්ඨ හා අනුලා